සැ. යු.- 2014.06.06 දින පළ වූ අංක 1,866 දරන ගැසට් පත්‍රයේ I : III සහ IV (අ) කොටස් පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,867 - 2014 ජුනි මස 13 වැනි සිකුරාදා - 2014.06.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 764 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජූලි මස 04 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජුනි මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

763- B 80848— 2,875 (2014/06)
F 1 -

# පළාත් සභා නිවේදන

### දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, පොල්පිතිගම ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 6 V යටතේ සභා සම්මත කරන ලද පහත සඳහන් යෝජනාවට එකී පනතේ ඉහත කී උපවගන්තියෙන් ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන් වෙත ලැබී ඇති බලතල යටතේ කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් එම්. එම්. නන්දන එස් කුමාර වන ම විසින් අනුමැතිය දෙනු ලැබ ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. නන්දන එස්. කුමාර,
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්,
කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කය.

2014 මැයි මස 21 වැනි දින,
කුරුණෑගල පළාත් පාලන සහකාර
කොමසාරිස් කාර්යාලයේ දී ය.


### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි පහත උපලේඛනයේ විස්තර කෙරෙන ප්‍රදේශය/ප්‍රදේශ දියුණු කළ ගම් ප්‍රදේශයක්/ප්‍රදේශ වශයෙන් පිළිගත යුතු බවත්,

එම පිළිගැනීමේ යෝජනා සම්මුතියට කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමට ක්‍රියා කළ යුතු බවත්, පොල්පිතිගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.


### උපලේඛනය I

පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මොරගොල්ලාගම ග්‍රාම සේවා වසමට අයත් වූ මොරගොල්ලාගම නගරයේ කුරුණෑගල මාර්ගයේ ආරම්භක ස්ථානය ලෙස බී. එම්. සී. බස්නායක මහතාගේ ව්‍යාපාර ස්ථානය ළඟ සිට උතුරට තලාව මාර්ගය ද, නැගෙනහිරට : බී. එම්. සී. බස්නායක මහතාගේ වෙළඳ සැලද, දකුණට : කුරුණෑගල පාර ද, බස්නාහිරට මොරගොල්ලාගම වැව් රක්ෂිතය දරන දේපල ද, අවසාන මායිම ලෙස පී. බී. විජේසුන්දර මහතාගේ නිවස ළඟ සිට උතුරට : තලාව පාර ද, නැගෙනහිරට : පී. බී. පී. විජේසුන්දර මහතාගේ නිවස ද, දකුණට : කුරුණෑගල මාර්ගය ද, බස්නාහිරට තැපැල් කාර්යාලය ද, මායිම් වන ප්‍රදේශ සහිත දේපල පහත සිතියමෙන් පෙන්නුම් කෙරේ.




## උපලේඛනය II

පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් අංක 404 කැරලන්කඩවල ග්‍රාම සේවා වසම තුළ පිහිටියා වූ පන්සියගම නගරයේ ආරම්භක ස්ථානය වන 1/13 බෝක්කුවට මායිම්ව උතුරට : ගලටබැදිවැව ද, දකුණට : දෙල්ගහගෙදර ද, නැගෙනහිරට : පන්සියගම දෙසට මාර්ගය ද, බස්නාහිරට : රඹේ දෙසට මාර්ගය ද, අවසාන මායිම ලෙස 5/11 බෝක්කුවේ මායිම ද, නැගෙනහිරට : ඩබ්. එම්. රංබණ්ඩා මහතාගේ වෙළඳසැල ද, බස්නාහිරට : සියඹලාගහ මුල ගෙදර ද, උතුරට : පන්සියගම දෙසට මාර්ගය ද, දකුණට : මඩහපොල දෙසට මාර්ගය ද, මායිම් වන ප්‍රදේශ සහිත දේපල පහත සිතියමෙන් පෙන්නුම් කෙරේ.




**උපලේඛනය III**

පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල සීමාවේ ගල්ටැංවැව මහව මාර්ගයේ ගල්ටැංවැව හතරමං හන්දිය ආරම්භක ස්ථානය ලෙස වන උතුරට : මඩගල්ල මාර්ගය ද, දකුණට : කළුගල්ල මාර්ගය ද, බස්නාහිරට : මහව මාර්ගය ද, අවසන් සීමාව ලෙස කදුරුවැව පාලම ස්ථානයෙන් උතුරට මහව මාර්ගය ද, බස්නාහිරට : O/G කම්හල ද, නැගෙනහිරට : පියදාසගේ ඉඩම ද, දකුණට කදුරුඇල රක්ෂිතය ද මායිම් වන ප්‍රදේශ සහිත දේපල පහත සිතියමෙන් පෙන්නුම් කෙරේ.




## උපලේඛනය IV

පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල සීමාවේ කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ ආරම්භක මායිම් වන කිඹුල්වානා ඔය හන්දිය ද, උතුරට : කුරුණෑගල මාර්ගය ද, නැගෙනහිරට : කිඹුල්වානා ඔය ද, දකුණට : මඩගල්ල මාර්ගය ද, බස්නාහිරට කිඹුල්වානා ඔය ද, අවසාන මායිම වන මඩගල්ල හතරමං හන්දිය ද, උතුරට : මොරගොල්ලාගම මාර්ගය ද, නැගෙනහිරට : වැලිමුත්තාව ප්‍රාදේශීය සභා මාර්ගය ද, දකුණට : කුරුණෑගල මාර්ගය ද, බස්නාහිරට මහව මාර්ගය ද, මායිම ඇති ප්‍රදේශ සහිත දේපල සිතියම පහතින් පෙන්නුම් කෙරේ.




## උපලේඛනය V

පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් මඩගල්ල මහව මාර්ගය ආරම්භක ස්ථානය වන මඩගල්ල හතරමං හන්දියට මායිම්ව උතුරට : මොරගොල්ලාගම මාර්ගය ද, නැගෙනහිරට : වැලිමුත්තාව ප්‍රාදේශීය සභා මාර්ගය ද, දකුණට : කුරුණෑගල දෙසට මාර්ගය ද, බස්නාහිරට මහව මාර්ගය ද, අවසාන ස්ථානය වන උතුරට : වෙල් යාය ද, දකුණට : පොතුවැපිටිය ප්‍රාදේශීය සභා මාර්ගය ද, නැගෙනහිරට මඩගල්ල දෙසට මාර්ගය ද, බස්නාහිරට මහව පාර මායිම් වූ ප්‍රදේශ සහිත දේපල පහත සිතියමෙන් පෙන්නුම් කෙරේ.



### උපලේඛනය VI

පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ගල්ටැංවැව කෝරුවාව මාර්ගයේ ගල්ටැංවැව හන්දියේ සිට ආරම්භක ස්ථානය වන උතුරට : මඩගල්ල දෙසට මාර්ගය ද, දකුණට : කළුගල් මාර්ගය ද, නැගෙනහිරට : කුරුණෑගල මාර්ගය ද, බස්නාහිරට : මහව දෙසට මාර්ගය ද, ගල්ටැංවැව හිරිපිටිය අවසාන මායිම ලෙස ආර්. එම්. ආරියවතී මහත්මියගේ නිවස ද, උතුරට : කෝරුවාව පාසල ද, දකුණට : රණවකගේ නිවස ද, බස්නාහිරට : කළුගල්ල දෙසට මාර්ගය ද, නැගෙනහිරට ආර්. එම්. මුදියන්සේ නිවස ද, මායිම් වූ ප්‍රදේශ සහිත දේපල පහත සිතියමෙන් පෙන්නුම් කෙරේ.




06-277